# හින්දි භාෂාව

## 10 ශ්‍රේණිය

### ගුරු මාර්ගෝපදේශය
(2015 සිට ක්‍රියාත්මක වේ)





සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්වි භාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
www.nie.lk

# හින්දි භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 10 ශ්‍රේණිය

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

හින්දී භාෂාව

ගුරු මාර්ගෝපදේශය

10 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2015

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය, විදේශ භාෂා හා ද්විභාෂා අධ්‍යාපන දෙපාර්තමේන්තුව

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව.

*වෙබ් අඩවිය :www.nie.lk*

*විද්‍යුත් තැපෑල :info@nie.lk*

මුද්‍රණය -

ජාතික අධ්‍යාපන ආයතනය

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශ කරන ලද ජාතික මට්ටමේ නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වු අධ්‍යාපනය වෙනුවට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර, වර්ෂ 2007 දී ශ්‍රී ලංකාවේ ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

නව විෂයමාලා චක්‍රයේ දෙවන අදියර 2015 වර්ෂයේ දී හය වන සහ දහ වන ශ්‍රේණි සඳහා හඳුන්වා දීම කළ යුතු ව තිබේ. මේ සඳහා පර්යේෂණවලින් අනාවරණය වු කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව අවධානය යොමු කරන විවිධ පාර්ශවයන්ගේ යෝජනා ද පදනම් කොට ගෙන විෂය නිර්දේශ තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක් ජාතික අධ්‍යාපන ආයතනය විසින් හඳුන්වා දෙනු ලැබීය.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා මට්ටම්, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩ නැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කරන ලදි. විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත්වීම හැකිතාක් අවම කිරීම, වැඩි බර පැටවීම්වලින් යුක්ත විෂය අන්තර්ගතයන් අඩු කිරීම, සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිතුරු විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය භාවිත කර ඇත.

ගුරු භවතුන් සඳහා පාඩම් සැලසුම් කිරීම, ඉගැන්වීම, ක්‍රියාකාරකම් කරගෙන යෑම, මැනීම් හා ඇගයීම් යනා දී අංශයන් සඳහා අවශ්‍ය වන්නා වූ මාර්ගෝපදේශයන් ලබාදීමේ අරමුණින් මෙම නව ගුරු මාර්ගෝපදේශය හඳුන්වා දී ඇත. පංති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශයන් උපකාර වනු ඇත. සිසුන්ගේ නිපුණතාවන් වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායී වීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා අලුතින් සංවර්ධනය කර ඇති පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් සිසු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට වෙනස්වීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශය සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය ද ආයතන සභාව ද නන් අයුරින් දායකත්වය ලබා දුන් සියලු ම සම්පත්දායකයන් හා අනිකුත් පාර්ශවයන්ගේ ඉමහත් කැපවීම ඇගැයීමට ද මෙය අවස්ථාවක් කර ගනු කැමැත්තෙමි.

**අධ්‍යක්ෂ ජනරාල්**

**ජාතික අධ්‍යාපන ආයතනය**

## නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

2015 වර්ෂයේ විෂයමාලා ප්‍රතිසංවිධානය යටතේ විදේශ හා සම්භාව්‍ය භාෂා සඳහා ගුරු මාර්ගෝපදේශ හඳුන්වාදීමට ලැබීම ඉතා සතුටට කරුණකි. වර්තමානයේ දී, ජාත්‍යන්තරය සහ ගෝලීයකරණය තුළ විදේශ භාෂා සඳහා හිමි වන්නේ සුවිශේෂ වැදගත්කමකි. විවිධ සමාජ මට්ටම් තුළ විවිධ භාෂාවල භාවිතය, ඉතා සීමිත භාෂා කිහිපයක පවත්නා භාෂාත්මක අධිරාජ්‍යවාදය මුලිනුපුටා දමයි.

වර්තමානයේ දී, ශ්‍රී ලාංකිකයන් තුළ භාෂා ඉගෙන ගැනීම සඳහා ඉතා විශාල ඉල්ලුමක් සහ උනන්දුවක් පවතියි. 2015 වර්ෂයේ දී චීන, රුසියන් සහ කොරියන් යන භාෂා ද සාමාන්‍ය පෙළ විෂයමාලාවට ඇතුළත් වී ඇති හෙයින් ශිෂ්‍යයන්ට ජපන්, ජර්මන්, ප්‍රංශ, හින්දි, පාලි, සංස්කෘත සහ අරාබි යන විෂයයන්ට අමතර ව ඉහත භාෂා ද හැදෑරීමේ අවස්ථාව උදාවනු ඇත.

මෙම ගුරු මාර්ගෝපදේශය විෂය නිර්දේශයේ සඳහන් එක් එක් නිපුණතාවන් අත්පත් කර ගැනීම සඳහා ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගත යුතු ආකාරය පිළිබඳ ව ගුරුවරයාට මග පෙන්වීමක් කර ඇත. ඒ අනුව විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශයේ සඳහන් උපදෙස් අනුව වඩා හොඳ ඉගැනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමේ නිදහස ගුරුවරයාට හිමි වේ.

මෙම ගුරු මාර්ගෝපදේශය සකස් කිරීම සඳහා දායකත්වය ලබාදුන් බාහිර සම්පත් පුද්ගල කණ්ඩායමට ද මෙම පොත සකස් කිරීමේ වගකීම දැරූ ව්‍යාපෘති නායක සහ ඒ සඳහා සහාය දුන් ජාතික අධ්‍යාපන ආයතනයේ කාර්ය මණ්ඩලයට ද මාගේ ස්තූතිය හිමි වේ.

**නියෝජ්‍ය අධ්‍යක්‍ෂ ජනරාල්**
**විකල්ප අධ්‍යාපන හා ගුරු අධ්‍යාපන පීඨය**
**ජාතික අධ්‍යාපන ආයතනය**

## විෂයමාලා කමිටුව

| | | |
|---|---|---|
| උපදේශකත්වය හා අනුමැතිය | - | ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය සම්බන්ධීකරණය | - | ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක,<br>සහකාර කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| විෂය සංස්කරණය | - | මහාචාර්ය උපුල් රංජිත් හේවාවිතානගමගේ,<br>අධ්‍යයනාංශ ප්‍රධාන,<br>හින්දී අධ්‍යයනාංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය. |
| ලේඛක මණ්ඩලය | - | **බාහිර**<br>මහාචාර්ය ලක්ෂ්මන් සෙනෙවිරත්න,<br>පීඨාධිපති,<br>මානව ශාස්ත්‍ර පීඨය,<br>කැලණිය විශ්වවිද්‍යාලය.<br><br>අනූෂා නිල්මිණී සල්වතුර,<br>ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය,<br>හින්දී අධ්‍යයනාංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය.<br><br>නීතා සුභාෂිණී සෙනෙවිරත්න,<br>කථිකාචාර්ය,<br>හින්දී අධ්‍යයනාංශය,<br>කැලණිය විශ්වවිද්‍යාලය.<br><br>බ්‍රසිල් නාගොඩවිතාන,<br>කථිකාචාර්ය,<br>භාෂා අධ්‍යයනාංශය,<br>සබරගමුව විශ්වවිද්‍යාලය.<br><br>ආර්.ජේ.කේ. අනෝමා,<br>ගුරු සේවය,<br>ගම්පහ බණ්ඩාරනායක විද්‍යාලය.<br><br>ඩබ්.එම්. මාධවී ඩී ජයරත්න,<br>ගුරු සේවය,<br>කු/ මලියදේව බාලිකා විද්‍යාලය.<br><br>**අභ්‍යන්තර**<br>ඊ.එම්. තනුජා ගීතානි ජයතිලක,<br>සහකාර කථිකාචාර්ය,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |
| පරිගණක වදන් සැකසුම | | එස්.ඒ.පී.එම්. සමරසිංහ,<br>තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව,<br>ජාතික අධ්‍යාපන ආයතනය. |

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

2007 නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණය යටතේ පාසල් පද්ධතියට හඳුන්වා දී ඇති නිපුණතා පාදක විෂයමාලාව පාසල් අධ්‍යාපනයේ පූර්ණ පරිවර්තනයක් ඇතිවන ආකාරයෙන් සැලසුම් කර තිබේ. නිපුණතාවක් යනු දැනුම (Knowledge), ආකල්ප (Attitudes), කුසලතා (Skills) , පෞද්ගලික හා සමාජයීය හැකියා (Personal & Social Abilities) යන මේ සංරචකවලින් සමන්විත වූවකි. ඒ අනුව වැඩ කරන හෝ ඉගෙන ගන්නා තත්ත්වයන් තුළ දැනුම, ආකල්ප, කුසලතා, පෞද්ගලික හා සමාජයීය හැකියා යොදාගැනීම නිපුණතාවක් ලෙස හැඳින්විය හැකි ය.

හින්දී විෂය නිර්දේශය ද නිපුණතා පාදක වූවකි. පාසල් සිසුන්ගේ චින්තන කුසලතා, පුද්ගල කුසලතා හා සමාජ කුසලතා ද ගොඩ නැගීමේ අරමුණෙන් පාසල් තුළ හින්දී භාෂාව ඉගැන්වීම කළ යුතු වේ. ඒ වෙනුවෙන් සැකසුණු නිපුණතා පාදක විෂය නිර්දේශයට අනුව මෙම ගුරු මාර්ගෝපදේශය නිර්මාණය කොට ඇත. එහිදී විෂය භාර ගුරුභවතා පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමුකොට ඉගැන්වීමේ ක්‍රියාවලියෙහි නිරත විය යුතු වේ.

10 ශ්‍රේණිය සඳහා නිපුණතා 6ක් හා ඒ ඒ නිපුණතාවට අදාළ නිපුණතා මට්ටම් විෂය නිර්දේශයේ ඇතුළත් වේ. එහි 1, 2 යන නිපුණතා හින්දී භාෂාවේ නිවැරදි උච්චාරණය සහ නිවැරදි ලේඛනය සඳහා ශිෂ්‍යයා හුරු කරවයි. 3, 4 යන නිපුණතා මගින් හින්දී භාෂාව ශ්‍රවණයෙන් අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීමේ හැකියාව ද හින්දී භාෂාව සරල ව කථා කිරීමේ හැකියාව ද ශිෂ්‍යයා තුළ ඇති කරයි. 5 නිපුණතාව හින්දී භාෂාව හා සම්බන්ධ ව්‍යාකරණ පිළිබඳ මූලික අවබෝධය ශිෂ්‍යයා තුළ ඇති කරයි. 6 නිපුණතාව මගින් හින්දියෙන් ගණන් කිරීමේ හැකියාව ලබා දෙයි. ගුරුවරයාට ඉගැන්වීමේ පහසුව සඳහා ද, ශිෂ්‍යයාට ඉගෙන ගැනීමේ පහසුව සඳහා ද, පරිශීලන ග්‍රන්ථ ආධාර කර ගත හැකි ය. පන්ති කාමර අධ්‍යාපනය මෙන් ම ක්ෂේත්‍ර අධ්‍යාපනය ද මෙහි දී යොදා ගත යුතු අතර තාක්ෂණික ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය ද භාවිතයට ගැනීම අවශ්‍ය වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී හා පාඩම් සැලසුම්කරණයේ දී ඉගෙනුම් පල ගුරුවරයාට බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඉගෙනුම් පල යනු යම් පාඩමක් ඉගෙන ගැනීමෙන් අනතුරු ව සිසුවා සාධනය කර ගනී යැයි අපේක්ෂිත ප්‍රතිඵලය යි. ගුණාත්මක යෙදවුම්, පාඩමේ සංවර්ධනය සඳහා ද ඉගෙනුම් ක්‍රියාවලියේ ඒකාකාරී, නීරස බව ඉවත් කරමින් එහි ප්‍රතිඵලදායක වර්ධනයක් ඇති කිරීම සඳහා ද පිටුවහල් කර ගත හැකි ය. පන්ති කාමර ඉගෙනුම් ක්‍රියාවලිය සාර්ථක ව සිදු වන්නේ දැයි සොයා බැලීම ගුරුවරයාගේ ප්‍රධාන වගකීමක් වන අතර, ඒ සඳහා තක්සේරුව හා ඇගයීම ගුරුවරයාට ප්‍රයෝජනවත් වේ. එමගින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය මෙන් ම ගුරු සිසු අන්‍යෝන්‍ය සබඳතාව ද තහවුරු වේ.

නිපුණතා හා නිපුණතා මට්ටම් කෙරෙහි සැලකිලිමත් වෙමින් විෂය අන්තර්ගතය කෙරෙහි දැඩි අවධානය යොමුකොට අපේක්ෂිත ඉගෙනුම් පල පාඩම අවසානයේ දී ශිෂ්‍යයා තුළින් ප්‍රකට වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ නියුක්ත විය යුතු ය. සෑම නිපුණතා මට්ටමක් සඳහා ම අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය ලබා දී ඇති අතර යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් දක්වා ඇත. පන්ති කාමරයට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුවරයාට මෙහි දී නිදහස හිමි වේ. මෙහි කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොඉක්මවන පරිදි නිපුණතාවන්ට වෙන්කර ඇති කාලච්ඡේද ප්‍රමාණය සංශෝධනය කරගැනීමට ගුරුවරයාට නිදහස ඇත. තක්සේරුව හා ඇගයීම් වැඩපිළිවෙළ, ලබා දී ඇති නිර්ණායක පදනම්කොට ගනිමින් ඒවා ශිෂ්‍යයා තුළින් ප්‍රකටකොට ගැනීම සඳහා ඉගැන්වීම් කාර්යයේ මුල සිට අග දක්වා ම සිදුකළ හැකි ය. සිසුන්ගේ හැකියා නොහැකියා අනුව ඉදිරිපෝෂණය හා ප්‍රතිපෝෂණය ලබා දිය යුතු ය.

නිපුණතා පාදක අධ්‍යාපනයේ දී සාම්ප්‍රදායික ගුරු භූමිකාවේ පැහැදිලි වෙනසක් අපේක්ෂා කෙරේ. සාම්ප්‍රදායික ව භාවිත කළ දේශන ක්‍රමය පදනම් කරගත් සම්ප්‍රේෂණ ගුරු භූමිකාව වෙනුවට ගවේෂණයේ යෙදීමට සිසුවාට ඉඩ සළසමින් සිසු විභවතා මතු කර ගැනීමට සමත් පරිණාමන ගුරු භූමිකාවක අවශ්‍යතාව පැන නැගී ඇත. එබැවින් සාම්ප්‍රදායික පන්ති කාමර, ගුරු කේන්ද්‍රීය අධ්‍යාපනයෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය තුළ සිසුවා වෙත සමීප වීමටත් නවීන තාක්ෂණය ද ප්‍රයෝජනයට ගනිමින් සාර්ථක ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියක නිරත වීමට ගුරුවරයා මග පාදා ගත යුතු ය.

විෂය නිර්දේශයේ ඇතුළත් නිපුණතාවලට අදාළ විෂය අන්තර්ගතය ඇසුරින් නිපුණතා මට්ටම් සාක්ෂාත් වන පරිදි ඉගැන්වීම් ක්‍රියාවලියේ යෙදී ඉගෙනුම් පල අත්පත් කර ගත යුතු අතර, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ගුරු ස්වාධීනත්වය අනුව නිර්මාණාත්මක ව සිදු කර ගත යුතු ය.

**ව්‍යාපෘති නායක**

# පටුන


| | පිටු අංක |
|---|---|
| අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| විෂයමාලා කමිටුව | v |
| ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| පටුන | viii |
| විෂය නිර්දේශය | ix-xxv |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස් | xxvi |
| නිපුණතාව 1 | 01 |
| නිපුණතාව 2 | 04 |
| නිපුණතාව 3 | 08 |
| නිපුණතාව 4 | 10 |
| නිපුණතාව 5 | 13 |
| නිපුණතාව 6 | 21 |
| තක්සේරුව හා ඇගයීම | 22 |
| ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක | 23-28 |

# හින්දි
## විෂය නිර්දේශය
## 10 ශ්‍රේණිය

## හැඳින්වීම

හින්දී භාෂාව අපගේ අසල්වැසි රට වන ඉන්දියාවේ රාජ්‍ය භාෂාවයි. එය උතුරු ඉන්දියාවේ ජනගහනයෙන් අඩකට වඩා වැඩි සංඛ්‍යාවකගේ මව්බස ද වේ. ඊට අමතර ව සුරිනාම්, ෆිජී, ගයානා, ට්‍රිනිඩෑඩ් සහ මැදපෙරදිග රටවල ද බහුල වශයෙන් ව්‍යවහාර වේ.විදේශ භාෂාවක් ලෙස ද ලෝකයේ බොහෝ රටවල හින්දී භාෂාව උගන්වනු ලැබේ.

භාෂාත්මක වශයෙන් සිංහල භාෂාවට ඇති ඥාතිත්වයත්, ආගමික, සංස්කෘතික, සාහිත්‍යයික, ආර්ථික, දේශපාලනික හා සමාජයීය සම්බන්ධතාත් හේතු කොටගෙන විදේශීය භාෂාවක් ලෙස හින්දී භාෂාව ඉගෙනීම ශ්‍රී ලාංකිකයන්ට අතිශයින් වැදගත් වෙයි. සෞන්දර්ය විෂයයන්, මෙන් ම ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ආයුර්වේදය හැදෑරීමේ දී ද හින්දී භාෂාව, මාධ්‍ය භාෂාවක් ලෙස භාවිත කෙරෙයි. අධ්‍යාපනය සහ වන්දනාමාන කටයුතු සඳහා ඉන්දියාවට යෑමට අපේක්ෂා කරන පිරිසට ද හින්දී භාෂාව පිළිබඳ දැනුම මහෝපකාරී වෙයි.

විශේෂයෙන් ම ආර්ථික කටයුතුවල දී ශ්‍රී ලංකාව ඉන්දියාවට වඩාත් විවෘත වීම නිසා හින්දී භාෂාවේ වැදගත්කම සහ අවශ්‍යතාව ශ්‍රී ලාංකිකයන්ට තදින් ම දැනේ. එබැවින් ශ්‍රී ලාංකික ශිෂ්‍යයන්ට විදේශ භාෂාවක් ලෙස හින්දී භාෂාව හැදෑරීම වැදගත් වේ.

## ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබීය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලින් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟාකර ගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනා ගනු ලැබ ඇත. මෙම අරමුණු සපුරා ගැනීම අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගනු ලැබ ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම.

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම.

III මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම.

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම.

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම.

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩි දියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම.

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයන් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම.

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

.

## මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු ඉටුකර ගැනීමට දායක වනු ඇත.

(i) සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

සාක්ෂරතාව : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කර ගැනීම.

සංඛ්‍යා පිළිබඳ දැනුම : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය.

රූපක භාවිතය : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම.

තොරතුරු තාක්ෂණ ප්‍රවීණතාව : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද සේවා පරිශ්‍රයන් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම.

(ii) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා.

- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම, වැනි අගයයන්.

- චිත්තවේගී බුද්ධිය.

(iii) පරිසරයට අදාළ නිපුණතා
මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

සමාජ පරිසරය : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පෞද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්.

ජෛව පරිසරය : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුද, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා.

භෞතික පරිසරය : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදිතාව හා කුසලතාව. ඉගෙනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම, හැකියාවනට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම, යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා.

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහා ගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) "ඉගෙනීමට ඉගෙනුම" පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස්වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගෙන ගැනීමත් සඳහා පුද්ගලයන්ට ශක්තිය ලබා දීම.

(ජාතික අධ්‍යාපන කොමිෂන් වාර්තාව 2003)

## විෂය අරමුණු

1. හින්දී හින්දී භාෂාව නිවැරදි ව කියවීමේ සහ ලිවීමේ කෞශල්‍යය වර්ධනය කර ගැනීම.

2. හින්දී භාෂාවේ මූලික ව්‍යාකරණය සහ සරල භාෂා ප්‍රයෝග අවබෝධ කර ගැනීම.

3. හින්දී ගද්‍ය, පද්‍ය කොටස් මාතෘ භාෂාවටත්, මාතෘ භාෂාවෙන් හින්දී භාෂාවටත් පරිවර්තනය කිරීමේ හැකියාව ලබා ගැනීම.

4. භාරතීයයන් සමග සන්නිවේදනය කිරීමේ ශක්‍යතාව වර්ධනය කර ගැනීම.

5. භාරතීය සංස්කෘතියෙහි මූලධර්ම උකහාගෙන මානව හිතවාදී සමාජයක් ගොඩනැගීම සඳහා මංපෙත් විවර කර ගැනීම.

6. සෞන්දර්ය විෂයයන්, ඉතිහාසය, පුරාවිද්‍යාව සහ ආයුර්වේදය සම්බන්ධ දැනුම පුළුල් කර ගැනීම සඳහා මංපෙත් විවර කර ගැනීම.

7. සාහිත්‍ය රසාස්වාදයට රුකුලක් වීම.

**හින්දී** විෂය නිර්දේශය - 10 ශ්‍රේණිය

පාසල් වාර වශයෙන් බෙදා ගැනීමට යෝජිත සැලසුම

| ශ්‍රේණිය | වාරය | **නිපුණතා මට්ටම** | **කාලච්ඡේද සංඛ්‍යාව** |
|---|---|---|---|
| 10 | I | 1.1, 1.2, 1.3<br>2.1, 2.2, 2.3, 2.4, 2.5<br>3.1, 3.2<br>4.1 | 30 |
| | II | 3.3<br>4.2<br>5.1, 5.2, 5.5<br>6.1 | 30 |
| | III | 1.4<br>4.3, 4.4<br>5.3, 5.4, 5.6<br>6.2 | 30 |

## හින්දී විෂය නිර්දේශය - 2015
## 10 ශ්‍රේණිය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 1.0 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හැකියාව ලබයි | 1.1 හින්දී වර්ණ මාලාව නිවැරදි ව උච්චාරණය කරයි | • ස්වර සහ ව්‍යඤ්ජන උච්චාරණය<br>- अ, ऋ, ऐ, औ යන ස්වර උච්චාරණ විශේෂතා<br>- අනුනාසික ස්වර උච්චාරණය<br>- ण, ज्ञ, ड़, ढ़, ज़, फ़ යන ව්‍යඤ්ජන උච්චාරණ විශේෂතා<br>- මහාප්‍රාණ ව්‍යඤ්ජන උච්චාරණය | • හින්දී ස්වර උච්චාරණය කරයි.<br>• හින්දී ව්‍යඤ්ජන උච්චාරණය කරයි.<br>• හින්දී ස්වර හා ව්‍යඤ්ජනවල දක්නට ලැබෙන උච්චාරණ විශේෂතා පැහැදිලි කරයි.<br>• හින්දී ස්වර, ව්‍යඤ්ජන හා සිංහල ස්වර, ව්‍යඤ්ජනවල උච්චාරණය සංසන්දනය කරයි. | 02 |
| | 1.2 හින්දී වචන නිවැරදි ව උච්චාරණය කරයි | • වචන උච්චාරණය<br>- පදාන්ත හල් උච්චාරණය<br>- ह ට පෙර अ ස්වරයේ උච්චාරණය<br>- ह ට පෙර ए ස්වරයේ උච්චාරණය<br>- य ට පෙර ऐ ස්වරයේ උච්චාරණය<br>- व ට පෙර औ ස්වරයේ උච්චාරණය | • පදාන්ත ව්‍යඤ්ජනය හල් ව උච්චාරණය කරයි.<br>• අනුස්වාරය හා අර්ධ අනුස්වාරය පිළිබඳ සැලකිලිමත් වෙමින් වචන උච්චාරණය කරයි.<br>• අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය අර්ථ භේදයට හේතුවන බව අවබෝධ කරගෙන වචන උච්චාරණය කරයි.<br>• සංයුක්ත ව්‍යඤ්ජන සහිත වචන නිවැරදි ව උච්චාරණය කරයි. | 02 |
| | 1.3 හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි | • අක්ෂරවල උච්චාරණ විශේෂතා සහ විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් වෙමින් සරල සහ සංයුක්ත වාක්‍ය නිවැරදි ව උච්චාරණය කිරීම. (විරාමය, ප්‍රශ්නාර්ථය, අර්ධ විරාමය, හර්ෂාදී ලකුණ) | • උච්චාරණ විශේෂතා පිළිබඳ සැලකිලිමත් වෙමින් වාක්‍ය කියවයි.<br>• විරාමාදී ලක්ෂණ ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය කියවයි.<br>• හඬ පාලනයකින් යුතු ව පැහැදිලි ව වාක්‍ය කියවයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 1.4 සරල ගද්‍ය, පද්‍ය කියවයි. | • සරල ගද්‍ය සහ පද්‍ය පාඨ, අක්ෂරවල උච්චාරණ විශේෂතා සහ විරාම ලක්ෂණ පිළිබඳ ව සැලකිලිමත් වෙමින් හඬ පාලනයකින් යුතු ව ශබ්ද නගා කියවයි. | • උච්චාරණ විශේෂතා පිළිබඳ සැලකිලිමත් වෙමින් ගද්‍ය සහ පද්‍ය පාඨ කියවයි.<br>• විරාමාදී ලක්ෂණ ගැන සැලකිලිමත් වෙමින් ගද්‍ය සහ පද්‍ය පාඨ කියවයි.<br>• හඬ පාලනයකින් යුතු ව පැහැදිලි ව ගද්‍ය පාඨ සහ පද්‍ය පාඨ කියවයි. | 02 |
| 2.0 හින්දී භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි | 2.1 සම්මත හින්දී වර්ණ මාලාව නිවැරදි ව ලියයි | • ශිරෝ රේඛාව පිළිබඳ සැලකිලිමත් වෙමින් ස්වර හා ව්‍යඤ්ජන ලිවීම. | • හින්දී ස්වර නිවැරදි ව ලියයි.<br>• හින්දී ව්‍යඤ්ජන නිවැරදි ව ලියයි.<br>• සංයුක්ත ව්‍යඤ්ජන නිවැරදි ව ලියයි.<br>• ශිරෝ රේඛාව නිවැරදි ව භාවිත කරයි. | 10 |
| | 2.2 ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි. | • පිල්ලම් භාවිතය පිළිබඳ රීතීන් අනුගමනය කරමින් ව්‍යඤ්ජනවලට පිල්ලම් යෙදීම. | • ස්වර පිල්ලම් සංකේත භාවිත කරයි.<br>• පිල්ලම් සංකේත නම් කරයි.<br>• පිල්ලම් භාවිතයේ විශේෂ යෙදුම් අවබෝධ කර ගෙන ලියයි. | 02 |
| | 2.3 ව්‍යඤ්ජන සංයුක්ත ව ලියයි. | • සම්මත සංයුක්ත ව්‍යඤ්ජන ලිවීම | • මධ්‍යරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලියයි.<br>• අන්තරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලියයි.<br>• නිරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලියයි. | 02 |
| | 2.4 හින්දී වචන නිවැරදි ව ලියයි | • හල් කිරීම සම්බන්ධ රීතීන් අනුගමනය කරමින් වචන ලිවීම | • රේඵය නිවැරදි ව යොදයි.<br>• රකාරාංශය නිවැරදි ව යොදයි.<br>• අනුස්වාරය නිවැරදි ව යොදයි.<br>• සම්මත නීති රීතිවලට අනුව ව්‍යඤ්ජන හා සංයුක්ත ලියයි. | 02 |
| | 2.5 සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලියයි | • පද බෙදීම හා විරාම ලක්ෂණ පිළිබඳ සැලකිලිමත් වෙමින් වාක්‍ය ලිවීම. (කොමාව, නැවතීමේ ලකුණ, ප්‍රශ්නාර්ථය, හර්ෂාදී ලකුණ) | • නිවැරදි ව පද වෙන් කරමින් වාක්‍ය ලියයි.<br>• අක්ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.<br>• විරාමාදී ලක්ෂණ භාවිත කරමින් වාක්‍ය ලියයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| 3.0 සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | 3.1 සවන් දී හින්දී ශබ්ද හඳුනා ගනියි. | • හින්දී ශබ්ද උච්චාරණයට සවන් දී අකුරු හඳුනා ගැනීම.<br>• අල්පප්‍රාණ, මහාප්‍රාණ භේදය හඳුනා ගැනීම.<br>• හින්දීයට අවේණික විශේෂ ශබ්ද හඳුනා ගැනීම.<br>• හින්දීයේ දී උච්චාරණයෙන් වෙනස් වූ ශබ්ද සංකේත හඳුනා ගැනීම. | • සවන් දී ශබ්දයට අදාළ අකුර තෝරයි.<br>• සවන් දී ශබ්දයට අදාළ අකුර ලියයි.<br>• සවන් දී ශබ්දයට අදාළ අකුර පෙන්වයි. | 02 |
| | 3.2 සවන් දී හින්දී වචන හඳුනා ගනියි. | • හින්දී වචනවලට සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීම. | • වචනවලට සවන් දී අදාළ රූපය තෝරයි.<br>• වචනවලට සවන් දී අදාළ රූපය පෙන්වයි. | 02 |
| | 3.3 සරල විධානයන්ට සවන් දී අර්ථය අවබෝධ කර ගනියි. | • සරල විධානයන්ට සවන් දී අර්ථය අවබෝධ කරගෙන ප්‍රතිචාර දැක්වීම. | • සරල විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි. | 02 |
| 4.0 භාෂණයෙහි යෙදෙයි. | 4.1 අවස්ථානුකූල ව ආචාර කරයි. | • පූජකවරුන්ට, වැඩිහිටියන්ට හා හිතවතුන්ට ආචාර කිරීම. | • අවස්ථානුකූල ව එකිනෙකාට ආචාර කරයි.<br>• අවස්ථානුකූල ව සුබ පතයි.<br>• ප්‍රතිචාර දක්වයි. | 02 |
| | 4.2 සුබ පතයි, ස්තුති කරයි. | • උපන් දිනයක දී, ජයග්‍රහණයක දී, උත්සව අවස්ථාවන්වල දී සුබ පැතීම, ස්තුති කිරීම. | | 02 |
| | 4.3 එකිනෙකා හඳුනා ගනියි. (තමා හා අන් අය) | • තමා හඳුන්වා දීම.<br>• අන් අය හඳුන්වා දීම. | • තමාගේ නම, වයස, ගම, පාසල හා පන්තිය ප්‍රකාශ කරයි.<br>• තම මිතුරාගේ නම, වයස, ගම, පාසල හා පන්තිය ප්‍රකාශ කරයි.<br>• සබකෝලයෙන් තොර ව, නිරවුල් ව අදහස් ප්‍රකාශ කරයි. | 02 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
| --- | --- | --- | --- | --- |
| | 4.4 පෞද්ගලික තොරතුරු විමසයි. ප්‍රතිචාර දක්වයි. | • නම, ගම, වයස, වෘත්තීය, ආදී වශයෙන් තොරතුරු විමසීම.<br>• විමසනු ලබන ප්‍රශ්නවලට පිළිතුරු දීම. | • තොරතුරු විමසයි.<br>• ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br>• ප්‍රශ්න වාචක පද නිවැරදි ව භාවිත කරයි. | 03 |
| 5.0 මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි. | 5.1 නාම පද භාවිත කරයි. | • නාම පදවල ලිංග භේදය හඳුනා ගැනීම.<br>• ඒකවචන නාම පද බහුවචනයට හැරවීම.<br>• විභක්ති ගැන්වීමේ දී නාම පදවල සිදුවන වෙනස්කම් හඳුනා ගැනීම. | • ලිංග භේදයට අනුව නාම පද වගු ගත කරයි.<br>• ඒක වචන පද බහු වචනයට හරවා ලියයි.<br>• බහු වචන පද ඒක වචනයට හරවා ලියයි.<br>• විභක්ති පදවල අර්ථය ප්‍රකාශ කරයි.<br>• විභක්ති ගැන්වීමේ දී නාම පදවල සිදු වන වෙනස්කම් විස්තර කරයි.<br>• විභක්ති ගැන්වූ නාම පද ඒක වචන, බහු වචන ලෙස වර්ග කරයි.<br>• නාම පද නිවැරදි ව විභක්ති ගන්වයි. | 08 |
| | 5.2 සර්ව නාම පද භාවිත කරයි. | • ඒකවචන සහ බහුවචන වශයෙන් සර්වනාම පද හඳුනා ගැනීම.<br>• විභක්ති ගැන්වීමේ දී සර්ව නාම පදවල සිදුවන වෙනස්කම් හඳුනා ගැනීම. | • සර්ව නාම පද ඒක වචන, බහු වචන වශයෙන් වර්ග කරයි.<br>• සර්ව නාම පුරුෂත්‍රය අනුව වර්ගීකරණය කරයි.<br>• සර්ව නාම පද හා ඒ සමග යෙදෙන වර්තමාන සහායක ක්‍රියාව නම් කරයි.<br>• සර්ව නාම යොදා සරල වාක්‍ය නිර්මාණය කරයි.<br>• විභක්ති ගැන්වීමේ දී සර්ව නාම පදවල රූපය වෙනස් වන හා වෙනස් නොවන ආකාර කියයි.<br>• සර්ව නාම පද නිවැරදි ව විභක්ති ගන්වයි.<br>• සර්ව නාම සහ විභක්ති යොදා වාක්‍ය නිර්මාණය කරයි. | 06 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද |
|---|---|---|---|---|
| | 5.3 විශේෂණ පද භාවිත කරයි. | • විකාරී සහ අවිකාරී විශේෂණ පද හඳුනා ගැනීම සහ භාවිතය.<br>• විභක්ති ගැන්වීමේ දී විශේෂණ පදවල සිදුවන වෙනස්කම් හඳුනා ගැනීම. | • විකාරි සහ අවිකාරි වශයෙන් විශේෂණ පද වර්ග කරයි.<br>• ලිංග, වචන සහ විභක්තිය හඳුනාගෙන විශේෂණ පද භාවිත කරයි.<br>• විශේෂණ පද යොදා වාක්‍ය නිර්මාණය කරයි. | 07 |
| | 5.4 විභක්ති ප්‍රත්‍ය යොදයි. | • में, पर, से, को, का, के, की, ने ප්‍රත්‍ය යොදා වාක්‍ය නිර්මාණය කිරීම. | • එක් විභක්ති ප්‍රත්‍යය විවිධාර්ථයෙන් යෙදිය හැකි බව කියයි.<br>• අර්ථයට අනුව යෝග්‍ය විභක්ති ප්‍රත්‍යය තෝරයි.<br>• විභක්ති ප්‍රත්‍ය භාවිත කරමින් වාක්‍ය ලියයි. | 08 |
| | 5.5 වර්තමාන කාල වාක්‍ය නිවැරදි ව භාවිත කරයි. | • සරල වර්තමාන කාලය<br>• සාමාන්‍ය වර්තමාන කාලය<br>• පවතින වර්තමාන කාලය | • පුරුෂත්‍රයට අදාළ සරල සහායක ක්‍රියා වාක්‍යවල යොදයි.<br>• අදාළ ප්‍රත්‍යය භාවිත කරමින් ක්‍රියා පද නිර්මාණය කරයි.<br>• උක්තයට ගැළපෙන පරිදි ක්‍රියා පදය යොදයි.<br>• සාමාන්‍ය වර්තමාන කාල ක්‍රියා පද සහ තාත්කාලික් වර්තමාන කාල ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.<br>• නිෂේධාර්ථ හා ප්‍රශ්නාර්ථ වාක්‍ය තනයි. | 10 |
| | 5.6 අනාගත කාල වාක්‍ය නිවැරදි ව භාවිත කරයි. | • සාමාන්‍ය අනාගත කාලය | • පුරුෂත්‍රයට අනුව සාමාන්‍ය අනාගත කාල ක්‍රියා ප්‍රත්‍යය යොදා ක්‍රියා පද නිර්මාණය කරයි.<br>• උක්තයට ගැළපෙන පරිදි ක්‍රියා පදය යොදයි.<br>• අනාගත කාලයෙන් අදහස් ප්‍රකාශ කරයි. | 06 |
| 6.0 හින්දීයෙන් ගණන් කිරීමේ හැකියාව ලබයි. | 6.1 පූර්ණ සංඛ්‍යා ගණන් කරයි. | • 1 සිට 25 දක්වා ගණන් කිරීම | • 1-25 දක්වා ගණන් කරයි.<br>• 1-25 දක්වා අපූර්ණ සංඛ්‍යා ගණන් කරයි.<br>• විවිධ ස්ථාන සඳහා සංඛ්‍යා භාවිත කරයි.<br>• සංඛ්‍යාවල නාගරී සංකේත ලියයි. | 02 |
| | 6.2 භාග සංඛ්‍යා ගණන් කරයි. | • කාල, භාගය, තුන්කාල, එකයි කාල, එක හමාර, දෙක හමාර සිට ඉදිරියට යෙදෙන භාග සංඛ්‍යා හඳුනා ගැනීම. | | 02 |

**පරිශීලන ග්‍රන්ථ**


- **'මානක් ව්‍යාවහාරික් හින්දී ව්‍යාකරණ් තථා රචනා'** (1995) ශ්‍යාම් ජී ගෝකුල් වර්මා, ආයී බුක් ඩිපෝ, කරෝල්බාද්, නයි දිල්ලී
- **'ආධුනික් හින්දී ව්‍යාකරණ් ඖර් රචනා'** (1996) වාසුදේව නන්දන් ප්‍රසාද්, භාරතී භවන්, පට්නා
- **'හින්දී වියරණ හුරුව'** (2005,2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ10.
- **'හින්දී ලේඛන හුරුව'** (2008) ලක්ෂ්මන් සෙනෙවිරත්න, කර්තෘ ප්‍රකාශනයකි.
- **'සිංහල හින්දී ප්‍රායෝගික ශබ්ද සංග්‍රහය'** (2004) ලක්ෂ්මන් සෙනෙවිරත්න, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, මරදාන පාර, කොළඹ 10.
- **'හින්දී කථන හුරුව'** (2010) ඉන්ද්‍රා දසනායක, ලක්ෂ්මන් සෙනෙවිරත්න, සමයවර්ධන ග්‍රන්ථ ප්‍රකාශකයෝ, කොළඹ 10.

**ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රමෝපාය**

4.1 ලේඛනය සහ උච්චාරණය හුරු කිරීම සඳහා

4.1.1 කණ්ඩායම් වශයෙන් වෙන් කොට උච්චාරණයට අදාළ ශබ්ද හඳුනා ගැනීමට සැලැස්වීම.

4.1.2 කියවන විට ලිවීම

4.1.3 ශ්‍රව්‍ය-දෘශ්‍ය මාධ්‍යයන් ඇසුරෙන් උච්චාරණ විශේෂතා අධ්‍යයනය කිරීමට සැලැස්වීම.

4.1.4 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ වචනයට අදාළ රූපයත්, රූපයට අදාළ වචනයත් හඳුනා ගැනීමට සැලැස්වීම.

4.2 ව්‍යාකරණය

4.2.1 සෑම ව්‍යාකරණ පාඩමකට ම අදාළ ව විවිධ අභ්‍යාස කරවීම.

4.2.2 කණ්ඩායම් වශයෙන් හෝ තනි තනිව ම හෝ ඉගෙනගත් ව්‍යාකරණ පාඩම් සිසුන් ලවා පැහැදිලි කිරීමට සැලැස්වීම.

4.3 සංවාද පුහුණුව

4.3.1 සිසුන්ගෙන් පිළිතුරු බලාපොරොත්තුවෙන් ප්‍රශ්න ඇසීම.

4.3.2 පිළිතුරට අදාළ ප්‍රශ්නය සිසුන් ලවා විමසවීම.

4.3.3 ක්ෂණික මාතෘකා යටතේ කෙටි වාක්‍ය නිර්මාණය කිරීම.

4.3.4 පින්තූර පෙන්වා විස්තර ඇසීම.

4.3.5 යුගල වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන් සංවාද පුහුණු කිරීම.

## 5.0 පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන්

හින්දී භාෂාව හැදෑරීමෙන් පසු එම දැනුම, කුසලතා හා නව ආකල්ප භාවිතයට ගනිමින් පාසලේ විෂය සමගාමී කටයුතු ලෙස පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කළ හැකි වනු ඇත. එනම්,

5.1 **'විශ්ව හින්දී දිනය/හින්දී භාෂා දිනය'** සැමරීම.

5.2 ස්ව නිර්මාණ ද ඇතුළත් **'හින්දී සගරාවක්'** නිර්මාණය කිරීම.

5.3 පාසලේ පැවැත්වෙන රැස්වීම්වල දී හින්දී බසින් ප්‍රවෘත්ති, කථා සහ ගීත ආදිය ඉදිරිපත් කිරීම.

5.4 උත්තර භාරතීය සංස්කෘතිය විදහා දැක්වෙන වැඩමුළු, ප්‍රදර්ශන ආදිය පැවැත්වීම.

5.5 පාසල තුළ හෝ අන්තර් පාඨශාලීය මට්ටමින් හෝ හින්දී බසින් රචනා, කථික, ගීත නිර්මාණ, නාට්‍ය ආදි තරග පැවැත්වීම.

5.6 හින්දී භාෂාව පිළිබඳ ව වැඩිදුර දැනුමක් ලබා දීම සඳහා තද්විෂය හා සම්බන්ධ වියතුන්ගේ සහභාගිත්වයෙන් සම්මන්ත්‍රණ පැවැත්වීම.

## 6.0 තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙළ කොට ක්‍රියාත්මක කිරීම අපේක්ෂිතයි. ඉගෙනුම් කාර්යයේ දී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලයන්ගේ ගුණාත්මක බව සොයාබැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදු වේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමග සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් සිසුවා සාක්ෂාත් කරගෙන තිබේදැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා-දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ හා ඉදිරි පෝෂණ වැඩසටහන් සංවිධානය කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

තක්සේරු කාර්යයට අමතර ව ඇගයීම් වැඩ පිළිවෙළ යනු ශිෂ්‍යයාගේ ප්‍රවීණතා මට්ටම තීරණය කිරීම ය. ප්‍රවීණතා මට්ටම විනිශ්චයේ දී සිසුන් හිමි කරගත් ශ්‍රේණි හා ලකුණු සසඳා ඔවුන්ගේ ප්‍රගතිය සොයා බැලිය යුතු ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා උපදෙස්

**නිපුණතාව** 1 හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** 1.1 හින්දී වර්ණ මාලාව නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

- හින්දී ස්වර උච්චාරණය කරයි.
- හින්දී ව්‍යඤ්ජන උච්චාරණය කරයි.
- හින්දී ස්වර හා ව්‍යඤ්ජනවල දක්නට ලැබෙන උච්චාරණ විශේෂතා පැහැදිලි කරයි.
- හින්දී ස්වර,ව්‍යඤ්ජන හා සිංහල ස්වර,ව්‍යඤ්ජනවල උච්චාරණය සංසන්දනය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- अ, ऋ, ऐ, औ යන ස්වර හැර සෙසු ස්වරවල උච්චාරණය සමාන බව.
- 'अ' ස්වරය උච්චාරණයේ දී සිංහල 'අ' ස්වරය තරම් විවෘත නොවන බව.
- 'ऋ' ස්වරය 'ඉරු' නොව 'රි' ලෙස උච්චාරණය කළ යුතු බව.
- 'ए', 'औ' යන ස්වරවලට උච්චාරණ දෙකක් ඇති බව (මූල ස්වර සහ සංයුක්ත ස්වර)
- හින්දියෙහි අනුනාසික ස්වර (සඤ්ඤක යෙදෙන බව).
- ව්‍යඤ්ජනවල අල්පප්‍රාණ මහාප්‍රාණ භේදය පිළිබඳ ව සැලකිලිමත් විය යුතු බව.
- ण, ड़, ढ़, ज, फ़ යන ව්‍යඤ්ජනවල උච්චාරණ විශේෂතා හඳුනාගත යුතු බව.
- अं ,अः ස්වර නොවන බව.
- ज़ සංයුක්ත ව්‍යඤ්ජනය නිවැරදි ව උච්චාරණය කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- වර්ණ මාලාව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට එහි පිටපතක් ලබා දෙන්න.
- ස්වර හා ව්‍යඤ්ජන උච්චාරණය කර පෙන්වන්න (මේ සඳහා ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක භාවිත කළ හැකි ය).
- සිසුන් ලවා උච්චාරණය කරවන්න.
- හින්දී සහ සිංහල ස්වර ව්‍යඤ්ජනවල උච්චාරණ විශේෂතා පැහැදිලි කර දෙන්න.
- උච්චාරණ සම්බන්ධ ක්‍රියාකාරකම්වල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හින්දී වර්ණ මාලාව,ශ්‍රව්‍ය දෘශ්‍ය ආධාරක,කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ස්වර සහ ව්‍යඤ්ජන නිවැරදි ව උච්චාරණය කරයි.
- හින්දී සහ සිංහල ස්වර,ව්‍යඤ්ජන සංසන්දනය කරමින් උච්චාරණය කරයි.
- මහාප්‍රාණ ව්‍යඤ්ජන හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.
- අනුනාසික ස්වර හඳුනාගෙන නිවැරදි ව උච්චාරණය කරයි.
- හින්දියට පමණක් ආවේණික ස්වර ව්‍යඤ්ජන හඳුනාගෙන උච්චාරණය කරයි.

**නිපුණතාව** 1 හින්දි භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** 1.2 හින්දී වචන නිවැරදි ව උච්චාරණය කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

- පදාන්ත ව්‍යඤ්ජනය හල් ව උච්චාරණය කරයි.
- උච්චාරණ විශේෂතා සැලකිල්ලට ගෙන වචන උච්චාරණය කරයි.
- අනුස්වාරය හා අර්ධ අනුස්වාරය පිළිබඳ සැලකිලිමත් වෙමින් වචන උච්චාරණය කරයි.
- අල්පප්‍රාණ මහප්‍රාණ භේදය අර්ථ භේදයට හේතුවන බව අවබෝධ කරගෙන වචන උච්චාරණය කරයි.
- සංයුක්ත ව්‍යඤ්ජන සහිත වචන නිවැරදිව උච්චාරණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වචනයක අග යෙදෙන ව්‍යඤ්ජනය හල් කර උච්චාරණය කළ යුතු බව.
  पुस्तक - 'පුස්තක' නොව 'පුස්තක්' ලෙස උච්චාරණය කළ යුතු බව.
- ह ට පෙර යෙදෙන अ ස්වරය 'ඇ' ලෙස උච්චාරණය කළ යුතු බව.
  पहला - 'පහ්ලා' නොව 'පැහ්ලා' බව.
- ह ට පෙර යෙදෙන ए ස්වරය හ්‍රස්ව වන බව.
  मेहनत - 'මේහනත්' නොව 'මෙහ්නත්' බව.
- य ට පෙර යෙදෙන ऐ ස්වරය 'ඓ' ලෙස උච්චාරණය කළ යුතු බව.
  भैया - 'භැයා' නොව 'භෛයා' බව.
- व ට පෙර යෙදෙන आ ස්වරය 'ඖ' ලෙස උච්චාරණය කළ යුතු බව.
  चौवन - 'චෝවන්' නොව 'චෞවන්' ලෙස උච්චාරණය කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- විශේෂයෙන් පැහැදිලි කළ යුතු උච්චාරණ විශේෂතා සහිත වචන සිසුන්ට ලබා දෙන්න.
- උච්චාරණය කර පෙන්වන්න.
- සිසුන් ලවා උච්චාරණය කරවන්න.
- උදාහරණවලට සමරූපී වෙනත් වචන සිසුන්ට ලබා දී උච්චාරණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- වචන ලේඛන, වචන ඇතුළත් කාඩ්පත්, හඬ පට

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- පදාන්ත ව්‍යඤ්ජනය හල් ව උච්චාරණය කරයි.
- මහාප්‍රාණ ව්‍යඤ්ජන සහිත වචන නිවැරදි ව උච්චාරණය කරයි.
- 'ह ' ට පෙර 'अ' ස්වරය නිවැරදි ව උච්චාරණය කරයි.
- 'ह' ට පෙර 'ए' ස්වරය නිවැරදි ව උච්චාරණය කරයි.
- 'य ' ට පෙර 'ऐ' ස්වරය නිවැරදි ව උච්චාරණය කරයි.
- 'व ' ට පෙර 'औ ' ස්වරය නිවැරදි ව උච්චාරණය කරයි.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | **1** | හින්දී භාෂාව නිවැරදි ව උච්චාරණය කිරීමේ හැකියාව ලබයි. |
| **නිපුණතා මට්ටම** | **1.3** | හින්දී වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි. |
| | **1.4** | සරල ගද්‍ය, පද්‍ය කියවයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 04 | |

**ඉගෙනුම් පල**

- උච්චාරණ විශේෂතා පිළිබඳ සැලකිලිමත් වෙමින් වාක්‍ය, ගද්‍ය පාඨ/ පද්‍ය පාඨ කියවයි.
- විරාමාදි ලක්ෂණ ගැන සැලකිලිමත් වෙමින් වාක්‍ය, ගද්‍ය පාඨ/ පද්‍ය පාඨ කියවයි.
- හඬ පාලනයකින් යුතු ව පැහැදිලි ව වාක්‍ය, ගද්‍ය පාඨ/ පද්‍ය පාඨ කියවයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වාක්‍ය උච්චාරණයේ දී උච්චාරණ විශේෂතා සැලකිල්ලට ගත යුතු බව.
- උච්චාරණයේ දී විරාමාදී ලකුණු පිළිබඳ ව අවධානය යොමු කළ යුතු බව.
- නිවැරදි ව හා පැහැදිලි ව වාක්‍ය උච්චාරණය කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සරල වාක්‍ය, ගද්‍ය/ පද්‍ය පාඨ සිසුන්ට ලබා දෙන්න.
- එක ම වාක්‍යය ප්‍රකාශන, ප්‍රශ්නාර්ථ හා විශ්මයාර්ථ සහිත ව උච්චාරණය කර පෙන්වන්න.
- සිසුන් ලවා උච්චාරණය කරවන්න.
- උදාහරණ වාක්‍යවලට අමතර ව වෙනත් වාක්‍ය, ගද්‍ය/ පද්‍ය පාඨ සිසුන්ට ලබා දී උච්චාරණය කරවන්න.
- වැරදි නිවැරදි කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සරල සංවාද
- හඬ පට

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- පූර්ණ විරාමය සහිත වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.
- ප්‍රශ්නාර්ථය සහිත වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.
- විශ්මයාදී ලකුණ සහිත වාක්‍ය නිවැරදි ව උච්චාරණය කරයි.
- උච්චාරණ විශේෂතා හඳුනාගෙන නිවැරදි ව පැහැදිලි ව ගද්‍ය පාඨ/ පද්‍ය පාඨ උච්චාරණය කරයි.

**නිපුණතාව** **2** හින්දී භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** **2.1** සම්මත හින්දී වර්ණ මාලාව නිවැරදි ව ලියයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 10

**ඉගෙනුම් පල**

- හින්දී ස්වර නිවැරදි ව ලියයි.
- හින්දී ව්‍යඤ්ජන නිවැරදි ව ලියයි.
- සංයුක්ත ව්‍යඤ්ජන නිවැරදි ව ලියයි.
- ශිරෝ රේඛාව නිවැරදි ව භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හින්දී ලිවීමේ දී නාගරී අකුරු (සංශෝධන සහිත ව) භාවිත කරන බව.
- හින්දී ලිවීමේ දී සම්මත හින්දී වර්ණ මාලාව යොදා ගත යුතු බව.
- अ, आ, आ, औ, थ, ध, भ, क्ष, श्र යන අකුරු ලිවීමේ දී ශිරෝ රේඛාව ඛණ්ඩනය කර ලිවිය යුතු බව.
- හින්දී අකුරු ලිවීමේ දී රූලට සමපාත වන සේ ශිරෝ රේඛාව යෙදිය යුතු බව.
- හින්දී ව්‍යඤ්ජනවල මධ්‍ය රේඛීය (मध्य खड़ीपाइी) අන්ත රේඛීය (अंत खड़ीपाइी) සහ නිරේඛීය (बिना खड़ीपाइी) වශයෙන් ආකාර තුනක් පවතින බව.
- श्र, त्र, क्ष, ज्ञ යනුවෙන් සංයුක්ත ව්‍යඤ්ජන ඇති බව .

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- හින්දී වර්ණමාලාව පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- වර්ණමාලාවේ ප්‍රධාන බෙදීම් පිළිබඳ ව සාකච්ඡා කරන්න.
- ශිරෝ රේඛාවේ භාවිතය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- හින්දී වර්ණමාලාව පැහැදිලි ව හා සුන්දර අත්අකුරින් ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් විසින් ලියනු ලබන අකුරු පරීක්ෂා කර වැරදි නිවැරදි කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සම්මත හින්දී වර්ණ මාලාව

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සම්මත හින්දී වර්ණ මාලාව නිවැරදි ව ලියයි.
- ශිරෝ රේඛාව නිවැරදි ව ලියයි.
- රේඛීය ව්‍යඤ්ජන (खड़ीपाइी) වර්ගීකරණය කරයි.
- ලස්සන අත් අකුරු ලියයි.

**නිපුණතාව** **2** හින්දී භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** **2.2** ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි.

කාලච්ඡේද සංඛ්‍යාව 02

**ඉගෙනුම් පල**

- ස්වර පිල්ලම් සංකේත භාවිත කරයි.
- පිල්ලම් සංකේත නම් කරයි.
- පිල්ලම් භාවිතයේ විශේෂ යෙදුම් අවබෝධ කර ගෙන ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- 'ि' ස්වර පිල්ලම අකුරට පෙර ලිවිය යුතු බව.
- සෙසු ස්වර පිල්ලම් අකුර ලිවීමෙන් පසු ව යෙදිය යුතු බව.
- र අකුරට उ ऊ ස්වර පිල්ලම් යෙදීමේ දී වෙනස් ආකාරයකට යෙදිය යුතු බව.
  (र‌ु නොව रु හා र‌ू නොව रू ලෙස)
- ह අකුරට ऋ ස්වර පිල්ලම යෙදීමේ දී हु ලෙස නොව हृ ලෙස යෙදිය යුතු බව.
- ඉස්පිලි හා පාපිලි අතරේ සිරස් රේඛාවට (खड़ीपाई) ස්පර්ශ වන ලෙස ලිවිය යුතු බව.
- ශිරෝ රේඛාවට උඩින් පිල්ලමක් යෙදෙන විට චන්ද්‍ර බින්දුව ( ँ ) වෙනුවට අනුස්වාර සංකේතය යෙදිය යුතු බව.
  ( मै ँ නොව मैं ලෙස දැක්වීම. )
- ස්වර පිල්ලම්වලට අමතර ව චන්ද්‍ර බින්දුව ( ँ ), අනුස්වාරය ( ं ), විසර්ගය ( ः ) නිරූපණය කෙරෙන සංකේත ඇති බව.

යෝජිත **ඉගෙනුම්** ඉගැන්වීම් ක්‍රියාවලිය

- පිල්ලම්, පිල්ලම් නාමය සහ පිල්ලම් යෙදීම දැක්වෙන වගුවක් ප්‍රදර්ශනය කරන්න.
- සිසුන් ලවා එය පිටපත් කරවන්න.
- අකුරේ ප්‍රමාණයට යෝග්‍ය වන පරිදි පිල්ලම් යෙදිය යුතු බව පැහැදිලි කර දෙන්න.
- වර්ණ මාලාවේ සියලු ම ව්‍යඤ්ජන අක්ෂරවල පිල්ලම් යෙදීමේ අභ්‍යාස ලබා දෙන්න.
- වැරදි නිවැරදි කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පිල්ලම් යෙදීම දැක්වෙන වගුවක්
- දෘශ්‍යාධාරක

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ස්වර පිල්ලම් නම් කරයි.
- උච්චාරණය කරන ශබ්දයට අනුව අදාළ පිල්ලම යොදයි.
- පිල්ලම් වගුවක් සකස් කරයි.
- අනුස්වාරය, විසර්ගය හා අර්ධ අනුස්වාරය නිවැරදි ව යොදයි.

**නිපුණතාව** 2 හින්දී භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** **2.3** ව්‍යඤ්ජන සංයුක්ත ව ලියයි.
**2.4** හින්දී වචන නිවැරදි ව ලියයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

- මධ්‍යරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලියයි.
- අන්තරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලියයි.
- නිරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලියයි.
- රේඵය නිවැරදි ව යොදයි.
- රකාරාංශය නිවැරදි ව යොදයි.
- අනුස්වාරය නිවැරදි ව යොදයි.
- සම්මත නීති රීතිවලට අනුව ව්‍යඤ්ජන සංයුක්ත ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- මධ්‍යරේඛීය, අන්තරේඛීය හා නිරේඛීය ව්‍යඤ්ජන සංයුක්ත කර ලිවීමේ ක්‍රම එකිනෙකට වෙනස් බව.
- හල් ' र ' සමඟ ව්‍යඤ්ජනයක් සංයුක්ත කිරීමේ දී රේඵය යෙදිය යුතු බව.
- ව්‍යඤ්ජනයක් සමඟ ' र ' සංයුක්ත වීමේ දී රකාරාංශය යෙදිය යුතු බව.
- නාසික්‍ය ව්‍යඤ්ජනයක් සමඟ වෙනත් ව්‍යඤ්ජනයක් සංයුක්ත කිරීමේ දී අනුස්වාරය යෙදිය හැකි බව.
- නාසික්‍ය ව්‍යඤ්ජනයක් ද්විත්ව වීමේ දී අනුස්වාරය නොයෙදෙන බව (गन्ना √ गंना ×).
- නාසික්‍ය ව්‍යඤ්ජන සංයුක්තයක් ඇති විට අනුස්වාරය නොයෙදෙන බව. (जन्म √ जंम ×)
- य, व, ह ට පෙර නාසික්‍ය ව්‍යඤ්ජනය නිරූපණයට අනුස්වාරය නොයෙදෙන බව.
  (कन्या √ कंया ×, समन्वय √ समंवय ×, नन्हा √ नंहा × )

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සම්මත ව්‍යඤ්ජන සංයුක්ත සහිත වචන මාලාවක් සිසුන්ට ලබා දෙන්න.
- සාකච්ඡා මාර්ගයෙන් ව්‍යඤ්ජන සංයුක්ත ලිවීමේ නීති රීති පැහැදිලි කර දෙන්න.
- යෝග්‍ය ක්‍රියාකාරකමක සිසුන් යොදවන්න.
- හරි වැරදි සාකච්ඡා කරන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ග්‍රන්ථ
- ශ්‍රව්‍ය දෘශ්‍ය පට

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ව්‍යඤ්ජන සංයුක්ත සහිත වචන අසා ලියයි.
- නිවැරදි ව්‍යඤ්ජන සංයුක්ත සහිත වචන තෝරයි.
- සදොස් වචන නිදොස් කර ලියයි.
- ව්‍යඤ්ජන සංයුක්ත සහිත වචන සොයා ලියයි.

**නිපුණතාව** 2 හින්දී භාෂාව නිවැරදි ව ලිවීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** **2.5** සරල හින්දී වාක්‍ය නිවැරදි ව ලියයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

- නිවැරදි ව පද වෙන් කරමින් වාක්‍ය ලියයි.
- අක්ෂර වින්‍යාසය පිළිබඳ සැලකිලිමත් වෙමින් වාක්‍ය ලියයි.
- විරාමාදී ලක්ෂණ භාවිත කරමින් වාක්‍ය ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වාක්‍ය ලිවීමේ දී සර්ව නාම හා විභක්ති ප්‍රත්‍ය එකට ලිවිය යුතු බව.
- නාම පද සමඟ විභක්ති ප්‍රත්‍ය වෙන් කොට ලිවිය යුතු බව.
- जी ,साहब ,मेडम, सर වෙන් කොට ලිවිය යුතු බව.
- वाला, कर, दार එකට ලිවිය යුතු බව (सब्जीवाला, दूकान्दार).
- අතීත කාල ක්‍රියා පදවල වර නැඟීම් රූප 'य' රූපයෙන් තැබිය යුතු බව (गया, गयी, गये).
- අව්‍ය පදවල යෙදෙන 'ए' ස්වරය 'ये' වශයෙන් නොව, 'ए' ලෙස තැබිය යුතු බව.
- වාක්‍ය ලිවීමේ දී විරාම ලක්ෂණ ගැන සැලකිලිමත් විය යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සම්මත පද වෙන් කිරීම ආදී නීති රීතිවලට අනුව සකස් වූ ගද්‍ය කොටසක් ලබා දෙන්න.
- පද වෙන් කිරීම හා අක්ෂර වින්‍යාසය සම්බන්ධ නීති රීති පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- විරාමාදී ලක්ෂණ යෙදීම පිළිබඳ ව සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- යෝග්‍ය අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ගද්‍ය, පද්‍ය පාඨ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- දී ඇති වාක්‍ය හෝ ගද්‍ය කොටස හෝ පද වෙන් කර නැවත ලියයි.
- දී ඇති විරාමාදී ලක්ෂණ රහිත වාක්‍ය හෝ ගද්‍ය කොටස හෝ විරාමාදී ලකුණ නිවැරදි ව යොදා ලියයි.
- අක්ෂර වින්‍යාස දෝෂ නිවැරදි කර ලියයි.
- නිවැරදි ලේඛන රීති අනුගමනය කරමින් වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** **3** සවන් දී අර්ථය අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

**නිපුණතා මට්ටම** **3.1** සවන් දී හින්දී ශබ්ද හඳුනා ගනියි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

- සවන් දී ශබ්දයට අදාළ අකුර තෝරයි.
- සවන් දී ශබ්දයට අදාළ අකුර ලියයි.
- සවන් දී ශබ්දයට අදාළ අකුර පෙන්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අවධානයෙන් සවන් දිය යුතු බව.
- වර්ණ මාලාවේ වර්ණවලට හිමි නිසි උච්චාරණ නිවැරදි ව හඳුනා ගත යුතු බව.
- ओ සහ औ යන ස්වර 2හි වෙනස හඳුනා ගැනීමට උච්චාරණ අවයව (තොල්) හැසිරෙන ආකාරය අවබෝධ කර දිය යුතු බව.
- न, ण, ड, ड़, ढ, ढ़, ज, ज़ හි වෙනස පිළිබඳ උච්චාරණ අවයව ආධාරයෙන් පැහැදිලි කර දිය යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ශබ්ද සංකේතය හා ඊට අදාළ උච්චාරණය සිසුන්ට පැහැදිලි කර දෙන්න.
- හින්දියට ම ආවේණික වූ උච්චාරණ කියා දීමේ දී උච්චාරණ අවයව පිහිටන ආකාරය පැහැදිලි කර දෙන්න.
- ශ්‍රවණ අභ්‍යාසවල යොදවන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට, ශබ්ද සංකේත සහිත කාඩ්පත්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සවන් දී නිවැරදි ව ශබ්ද සංකේත ලියයි.
- සවන් දී නිවැරදි ව ශබ්ද සංකේත ප්‍රදර්ශනය කරයි.
- සවන් දී නිවැරදි ව ශබ්ද සංකේත තෝරයි.

| | | |
|---|---|---|
| **නිපුණතාව** | **3** | සවන් දී අර්ථය අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි. |
| **නිපුණතා මට්ටම** | **3.2** | සවන් දී හින්දී වචන හඳුනා ගනියි. |
| | **3.3** | සරල විධානයන්ට සවන් දී අර්ථය අවබෝධ කර ගනියි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 04 | |

**ඉගෙනුම් පල**

- වචනවලට සවන් දී අදාළ රූපය තෝරයි.
- වචනවලට සවන් දී අදාළ රූපය පෙන්වයි.
- සරල විධානවලට සවන් දී ප්‍රතිචාර දක්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සවන් දී පන්තිකාමරයේ දී හා නිවසේ දී භාවිත කරන උපකරණවලට අදාළ වචන සවන් දී හඳුනා ගත යුතු බව.
- එදිනෙදා කෙරෙන ක්‍රියාකාරකම්වලට අදාළ හින්දී ක්‍රියා පද අවබෝධ කර ගත යුතු බව..
- නිවැරදි ප්‍රතිචාර දැක්වීම සඳහා අවධානයෙන් සවන් දිය යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- පන්තියේ සහ නිවසේ දක්නට ලැබෙන වස්තූන්වල වාග් කෝෂ ඥානය ලබා දෙන්න.
- එදිනෙදා ක්‍රියාකාරකම්වලට අදාළ හින්දී ක්‍රියාපද හඳුන්වා දෙන්න.
- සවන් දී වචන හඳුනා ගැනීමේ අභ්‍යාසවල නිරත කරවන්න.
- සරල විධානවලට සවන් දී ප්‍රතිචාර දැක්වීමේ අභ්‍යාසවල නිරත කරවන්න.
- සරල විධානයන්ට ප්‍රතිචාර දැක්වීම සඳහා උපයෝගී වන. अच्छा, ठीक है, अभी, हाँ, नहीं වැනි පද භාවිත කරන ආකාරය පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට, චිත්‍ර සටහන්, වීඩියෝ පට

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සවන් දී අදාළ රූපය තෝරයි.
- සවන් දී නිවැරදි පිළිතුර ලකුණු කරයි.
- පන්ති කාමරයේ/ නිවසේ උපකරණ පෙන්වයි.
- පන්ති කාමරයේ/ නිවසේ උපකරණ නම් කරයි.
- විධාන කරයි, ප්‍රතිචාර දක්වයි.

| | |
|---|---|
| **නිපුණතාව** | **4** භාෂණයෙහි යෙදෙයි. |
| **නිපුණතා මට්ටම්** | **4.1** අවස්ථානුකූල ව ආචාර කරයි.<br>**4.2** සුබ පතයි, ස්තුති කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | **04** |

**ඉගෙනුම් පල**

- අවස්ථානුකූල ව එකිනෙකාට ආචාර කරයි.
- අවස්ථානුකූල ව සුබ පතයි.
- ප්‍රතිචාර දක්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ආචාර කිරීමට අදාළ යෙදුම් හඳුනා ගත යුතු බව.
- පුද්ගල ස්වභාවය අනුව ආචාර කිරීමේ විධිවල වෙනසක් ඇති බව.
- සුභ පැතීමට අදාළ යෙදුම් හඳුනා ගත යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ආචාර කිරීමේ දී භාවිත කරන යෙදුම් පැහැදිලි කර දෙන්න.
- පුද්ගල ස්වභාවය අනුව යෙදුම් තෝරා ගැනීම පිළිබඳ අවබෝධයක් ලබා දෙන්න.
- नमस्ते, नमस्कार වැනි පද පොදුවේ භාවිත කළ හැකි බවත් प्रणाम යන පදය ගරු කටයුතු අයට පමණක් භාවිත කළ යුතු බව පැහැදිලි කර දෙන්න.
- එක් එක් අවස්ථාව අනුව සුබ පතන ආකාරයත් ප්‍රතිචාර දක්වන ආකාරයත් පැහැදිලි කර දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට, වීඩියෝ පට, චිත්‍රපට සංවාද

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- මිතුරන්ට ආචාර කරයි.
- වැඩිහිටියන්ට ආචාර කරයි.
- අවස්ථාවට අනුව සුබ පතයි.
- අවස්ථාවට අනුව ප්‍රතිචාර දක්වයි.
- සබකෝලයෙන් තොර ව භාෂණයෙහි යෙදෙයි.

**නිපුණතාව** 4 භාෂණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම** **4.3** එකිනෙකා හඳුනාගනියි. (තමා හා අන් අය)

**කාලච්ඡේද සංඛ්‍යාව** 02

**ඉගෙනුම් පල**

- තමාගේ නම, වයස, ගම, පාසල හා පන්තිය ප්‍රකාශ කරයි.
- තම මිතුරාගේ නම, වයස, ගම, පාසල හා පන්තිය ප්‍රකාශ කරයි.
- සබකෝලයෙන් තොර ව, නිරවුල් ව අදහස් ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තමා පිළිබඳ ව හඳුන්වාදීමේ දී තම නම, වයස, ගම, පාසල හා පන්තිය පිළිබඳ තොරතුරු ලබා දිය යුතු බව.
- තම මිතුරා පිළිබඳ හඳුන්වා දීමේ දී මිතුරාගේ නම, වයස, ගම, පාසල හා පන්තිය පිළිබඳ තොරතුරු ලබා දිය යුතු බව. .

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- තමා හඳුන්වා දීම සම්බන්ධ ආදර්ශනයක් ලබා දෙන්න.
- අන් අය හඳුන්වා දීම සම්බන්ධ ආදර්ශනයක් ලබා දෙන්න.
- සාකච්ඡා මාර්ගයෙන් තමා හා අන් අය හඳුන්වා දීමට අදාළ වාග් කෝෂය ලබා දෙන්න.
- සෑම සිසුවෙකුට ම භාෂණයේ යෙදීමට අවස්ථාව සලසා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- හඬ පට, දෙබස්වල ඡායා පිටපත්

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- තමා පිළිබඳ ව හඳුන්වා දෙයි.
- තම මිතුරා හෝ මිතුරිය හඳුන්වා දෙයි.
- සබකෝලයෙන් තොර ව භාෂණයෙහි යෙදෙයි.
- පැහැදිලිව වචන උච්චාරණය කරයි.

**නිපුණතාව** **4** භාෂණයෙහි යෙදෙයි.

**නිපුණතා මට්ටම** **4.4** පෞද්ගලික තොරතුරු විමසයි, ප්‍රතිචාර දක්වයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

- තොරතුරු විමසයි.
- ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- ප්‍රශ්න වාචක පද නිවැරදි ව භාවිත කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තොරතුරු විමසීමට අදාළ ප්‍රශ්න වාචක පද හඳුනා ගත යුතු බව.
- ආචාරශීලී ව පිළිතුරු දීමට අදාළ යෙදුම් දැන ගත යුතු බව.
- සංවාදයේ දී හඬ පාලනයට අවධානය දිය යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සංවාද අඩංගු ආදර්ශන සිසුන්ට ලබා දෙන්න.
- සිසුන් සංවාදයේ යොදවන්න.
- තමාට අදාළ ව සංවාදයක් ගොඩනගා පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- ශ්‍රව්‍ය දෘශ්‍ය පට, සංවාද ඇතුළත් පත්‍රිකා

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- ප්‍රශ්න වාචක පද නිවැරදි ව යොදයි.
- ප්‍රශ්නවලට නිවැරදි ව හා පැහැදිලි ව පිළිතුරු දෙයි.
- හඬ පාලනය කරයි.
- ආචාරශීලී ව කතා කරයි.
- සබකෝලයෙන් තොර ව කතා කරයි.

**නිපුණතාව** **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **5.1** නාම පද භාවිත කරයි. (අ)

**කාලච්ඡේද සංඛ්‍යාව** 05

**ඉගෙනුම් පල**

- ලිංග භේදයට අනුව නාම පද වගුගත කරයි.
- ඒක වචන පද බහු වචනයට හරවා ලියයි.
- බහු වචන පද ඒක වචනයට හරවා ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- හින්දීයේ ඇත්තේ ස්ත්‍රී ලිංග හා පුරුෂ ලිංග පමණක් බව.
- අප්‍රාණවාචී නාම පද ද මෙම ලිංග දෙකට බෙදී යන බව.
- බහු වචන සෑදීමේ දී වචනය අයත් ලිංගය හා වචනාන්තය පිළිබඳ අවධානය යොමු කළ යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඒක වචනයෙන් බහු වචන සෑදීමට වචනයේ අන්තය හා ලිංගය බලපාන ආකාරය පැහැදිලි කර දෙන්න.
- වචනාන්තය වචන උච්චාරණය කරන ආකාරයෙන් තීරණය කළ හැකි යැයි පෙන්වා දෙන්න.
- ප්‍රාණවාචී නාම පදවල ලිංගය අර්ථය අනුව තීරණය කළ හැකි බවත් අප්‍රාණවාචී නාම පදවල ලිංගය ව්‍යවහාරයෙන් මතක තබා ගත යුතු බවත් පැහැදිලි කර දෙන්න.
- ලිංගය සහ අන්තය පාදක කරගෙන බහු වචන සෑදීමේ නීති රීති පැහැදිලි කර දෙන්න.
- සිසුන් අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- නාම පදවල ලිංගය තෝරයි.
- ඒක වචන පද බහු වචනයට හරවා ලියයි..
- බහු වචන පද ඒක වචනයට හරවා ලියයි.
- බහු වචන පදවල ප්‍රත්‍ය දෙස බලා වචනයේ ලිංගය තෝරයි.

**නිපුණතාව** **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **5.1** නාම පද භාවිත කරයි (ආ)

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

- විභක්ති ප්‍රත්‍යවල අර්ථය ප්‍රකාශ කරයි.
- විභක්ති ගැන්වීමේ දී නාම පදවල සිදු වන වෙනස්කම් විස්තර කරයි.
- විභක්ති ගැන්වූ නාම පද ඒක වචන, බහු වචන ලෙස වර්ග කරයි.
- නාම පද නිවැරදි ව විභක්ති ගන්වයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විභක්ති ගැන්වීමේදී ඒක වචනයේ දී ඇතැම් නාම පද රූපයෙන් වෙනස් වන බවත් ඇතැම් නාම පද රූපයෙන් වෙනස් නොවන බව.
- බහු වචන නාම පද විභක්ති ගැන්වීමේ දී සැම අවස්ථාවක දී ම රූපය වෙනස් වන බව.
- විභක්ති ගැන්වීමේ දී ඒක වචන, බහු වචන වශයෙන් නාම පදවල සිදු වන වෙනස්කම් සම්බන්ධ නීති රීති අවබෝධ කර ගත යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- ඒක වචන නාම පද විභක්ති ගැන්වීමේ දී සිදු වන වෙනස්කම් හා ඊට අදාළ නීති රීති පහදා දෙන්න.
- බහු වචන නාම පද විභක්ති ගැන්වීමේ දී සිදු වන වෙනස්කම් හා ඊට අදාළ නීති රීති පහදා දෙන්න.
- නීති රීතිවලට පටහැනි අවස්ථා (ව්‍යතිරේක) පැහැදිලි කර දෙන්න.
- ඒක වචන, බහු වචන නාම පද විභක්ති ගැන්වීමේ අභ්‍යාසවල යොදවන්න.
- අවශ්‍ය ප්‍රතිපෝෂණ ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- අර්ථයට ගැළපෙන විභක්ති ප්‍රත්‍ය තෝරයි.
- නාම පදවලට විභක්ති ප්‍රත්‍ය යොදා ලියයි.
- නාම පද හා විභක්ති ප්‍රත්‍ය යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- සදොස් වාක්‍ය නිදොස් කර ලියයි.

**නිපුණතාව** 5 මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **5.2** සර්ව නාම පද භාවිත කරයි (අ)

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

- සර්ව නාම පද ඒක වචන, බහු වචන වශයෙන් වර්ග කරයි.
- සර්ව නාම පුරුෂත්‍රය අනුව වර්ගීකරණය කරයි.
- සර්ව නාම පද හා ඒ සමග යෙදෙන වර්තමාන සහායක ක්‍රියාව නම් කරයි.
- සර්ව නාම යොදා සරල වාක්‍ය නිර්මාණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සර්ව නාම ඒක වචන, බහු වචන හා උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ හා ප්‍රථම පුරුෂ වශයෙන් වර්ගීකරණය වන බව.
- आप සහ तुम යන සර්ව නාම පද නිත්‍ය බහු වචන වන අතර ඒවා එක් පුද්ගලයෙකු සඳහා ද යෙදිය හැකි බව.
- බහු වචන සර්ව නාම පද සමග 'लोग' යන පදය ද යෙදිය හැකි බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සර්ව නාම හඳුන්වා දෙන්න.
- සිසුන් සමග සාකච්ඡා කරමින් ඒවා පුරුෂත්‍රයට සහ ඒක වචන, බහු වචන ලෙස වර්ගීකරණය කරන්න.
- එම සර්ව නාම සමග යෙදෙන වර්තමාන සරල සහායක ක්‍රියා හඳුන්වා දෙන්න..
- සර්ව නාම යොදා සිසුන් ලවා වාක්‍ය නිර්මාණය කරවන්න.
- නිෂේධාර්ථ සහ ප්‍රශ්නාර්ථ වාක්‍ය නිර්මාණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සර්ව නාමයට අදාළ සරල සහායක ක්‍රියාව තෝරයි.
- සරල සහායක ක්‍රියාවට අදාළ සර්ව නාමය තෝරයි.
- සර්ව නාම සහ සරල සහායක ක්‍රියා භාවිත කර වාක්‍ය නිර්මාණය කරයි.
- පුරුෂත්‍රයට සහ වචන භේදයට අනුව සර්ව නාම වර්ගීකරණය කරයි.

**නිපුණතාව** **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **5.2** සර්ව නාම පද භාවිත කරයි (ආ)

**කාලච්ඡේද සංඛ්‍යාව** 03

**ඉගෙනුම් පල**

- විභක්ති ගැන්වීමේ දී සර්ව නාම පදවල රූපය වෙනස් වන හා වෙනස් නොවන වශයෙන් ඇති ආකාරය කියයි.
- සර්ව නාම පද නිවැරදි ව විභක්ති ගන්වයි.
- සර්ව නාම සහ විභක්ති යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- हम, आप, तुम යන සර්ව නාම පද විභක්ති ප්‍රත්‍ය ගැන්වීමේ දී රූපීය වෙනස්කමකට භාජනය නොවන බව.
- සෙසු සර්ව නාම පද විභක්ති ගැන්වීමේ දී රූපීය ව වෙනස් වන බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- වගුවක ආධාරයෙන් සර්ව නාම විභක්ති ගැන්වීම පැහැදිලි කර දෙන්න.
- රූප වශයෙන් සමාන යෙදීම් සිසුන්ට පෙන්වා දෙන්න.
- විභක්ති ගැන්වූ සර්ව නාම සහිත ගද්‍ය කොටසක් ඇසුරෙන් ඉහත සඳහන් කරුණු පැහැදිලි කර දෙන්න.
- යෝග්‍ය අභ්‍යාසවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සර්ව නාම සහ විභක්ති ප්‍රත්‍යවල සංයෝගය වගුවකින් නිරූපණය කරයි
- සර්ව නාම පද අතර ඇති රූපීය සමානතා සංසන්දනය කරයි.
- විභක්ති ගැන්වූ සර්ව නාම යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- සර්ව නාම හා විභක්ති සහිත සදොස් වාක්‍ය නිදොස් කර ලියයි.

| | |
|---|---|
| **නිපුණතාව** | **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** | **5.3** විශේෂණ පද භාවිත කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 06 |

**ඉගෙනුම් පල**

- විකාරි සහ අවිකාරි වශයෙන් විශේෂණ පද වර්ග කරයි.
- ලිංග, වචන සහ විභක්ති හඳුනාගෙන විශේෂණ පද භාවිත කරයි.
- විශේෂණ පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- 'ආ' ස්වරාන්ත විශේෂණ පද විකාරි විශේෂණ පද ලෙස හඳුනාගත යුතු බව.
- විකාරි විශේෂණ පද විශේෂ්‍යයේ ලිංගය, වචනය හා විභක්තිය අනුව රූපීය ව වෙනස් වන බව.
- අවිකාරි විශේෂණ පද විශේෂ්‍යය අනුව රූපීය ව වෙනස් නොවන බව.
- 'ආ' ස්වරාන්ත වුවත් රූපීය ව වෙනස් නොවන විශේෂණ පද කිහිපයක් ද ඇති බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සාකච්ඡා මාර්ගයෙන් විකාරි සහ අවිකාරි විශේෂණ පද හඳුන්වා දෙන්න.
- 'ආ' ස්වරාන්ත පදවල රූපීය වෙනස් වීම පැහැදිලි කර දෙන්න.
- 'ආ' ස්වරාන්ත වුවත් වෙනස් නොවන විශේෂණ පද හඳුන්වා දෙන්න.
- විකාරි සහ අවිකාරි විශේෂණ යොදා වාක්‍ය නිර්මාණය කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- විශේෂණ පද විකාරි සහ අවිකාරි වශයෙන් වර්ගීකරණය කරයි.
- විශේෂ්‍යයට ගැළපෙන විශේෂණ තෝරයි..
- ව්‍යාකරණයට ගැළපෙන විශේෂණ තෝරයි.
- විශේෂණ යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**නිපුණතාව** **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **5.4** විභක්ති ප්‍රත්‍ය යොදයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 08

**ඉගෙනුම් පල**

- එකම විභක්ති ප්‍රත්‍යය විවිධාර්ථයෙන් යෙදිය හැකි බව කියයි.
- අර්ථයට අනුව යෝග්‍ය විභක්ති ප්‍රත්‍යය තෝරයි.
- විභක්ති ප්‍රත්‍ය භාවිත කරමින් වාක්‍ය ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- එක් විභක්ති ප්‍රත්‍යයකට විවිධ අර්ථ ඇති බව.
- අපේක්ෂිත අර්ථය අනුව විභක්ති ප්‍රත්‍යය තෝරා ගත යුතු බව.
- का, के, की ප්‍රත්‍ය පමණක්, සම්බන්ධ වන පසු පදයේ ලිංග හා වචන භේදය අනුව යෙදිය යුතු බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- එක් එක් විභක්ති ප්‍රත්‍යයට ඇති විවිධාර්ථ පැහැදිලි කර දෙන්න.
- का, के, की ප්‍රත්‍ය වචනයේ ලිංග, වචන හා කාරක අනුව සැලකිලිමත් ව භාවිත කළ යුතු බව පැහැදිලි කර දෙන්න.
- විභක්තිවල විවිධාර්ථ ගැන්වෙන පරිදි සකස් කළ ගද්‍ය, පද්‍ය පාඨ කියවීම සඳහා ලබා දෙන්න.
- යෝග්‍ය අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- අර්ථයට අනුව විභක්ති ප්‍රත්‍ය තෝරයි.
- ගද්‍ය කොටසක යෙදී ඇති විභක්ති ප්‍රත්‍ය ගැන්වුණු පද තෝරා ලියයි.
- විභක්ති ප්‍රත්‍ය යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- විභක්ති ප්‍රත්‍ය සහිත සදොස් වාක්‍ය නිදොස් කර ලියයි.

**නිපුණතාව** **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි.

**නිපුණතා මට්ටම** **5.5** වර්තමාන කාල වාක්‍ය නිවැරදි ව භාවිත කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 10

**ඉගෙනුම් පල**

- පුරුෂත්‍රයට අදාළ සරල සහායක ක්‍රියා වාක්‍යවල යොදයි.
- අදාළ ප්‍රත්‍යය භාවිත කරමින් ක්‍රියා පද නිර්මාණය කරයි.
- උක්තයට ගැළපෙන පරිදි ක්‍රියා පදය යොදයි.
- සාමාන්‍ය වර්තමාන කාල ක්‍රියා පද සහ තාත්කාලික් වර්තමාන ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- නිෂේධාර්ථ හා ප්‍රශ්නාර්ථ වාක්‍ය තනයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සර්ව නාමයට අදාළ ව සහායක ක්‍රියාව යෙදිය යුතු බව.
- සාමාන්‍ය වර්තමාන ක්‍රියා පද සෑදීමේ දී උක්තයට ගැළපෙන පරිදි ता/ ते/ ती ප්‍රත්‍යවලින් එකක් ක්‍රියාමූලයට යෙදිය යුතු බව.
- තාත්කාලික් වර්තමාන කාලයේ දී උක්තයට ගැළපෙන පරිදි ක්‍රියා මූලයට रहा/ रहे/ रही ප්‍රත්‍යවලින් එකක් යෙදිය යුතු බව.
- සාමාන්‍ය වර්තමාන කාල වාක්‍යවල නිෂේධාර්ථයේ දී සරල සහායක ක්‍රියාව නොයෙදෙන බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සාමාන්‍ය හා තාත්කාලික් වර්තමාන ක්‍රියා සාදන ආකාරය පැහැදිලි කර දෙන්න.
- සාමාන්‍ය වර්තමාන කාල වාක්‍යවල නිෂේධාර්ථයේ දී සරල සහායක ක්‍රියාව නොයෙදෙන බව අවබෝධ කර දෙන්න.
- යෝග්‍ය අභ්‍යාස ලබා දෙන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- සර්ව නාමයට අදාළ සරල සහායක ක්‍රියාව තෝරයි.
- සාමාන්‍ය සහ තාත්කාලික් වර්තමාන කාල ක්‍රියා නිර්මාණය කරයි.
- සාමාන්‍ය සහ තාත්කාලික් වර්තමාන කාල වාක්‍ය නිර්මාණය කරයි.
- වාක්‍ය නිෂේධාර්ථයට හා ප්‍රශ්නාර්ථයට හරවා ලියයි.
- සදොස් වාක්‍ය නිදොස් කර ලියයි.
- උක්තයට අනුව යෝග්‍ය ක්‍රියා පද තෝරයි.

| | |
|---|---|
| **නිපුණතාව** | **5** මූලික ව්‍යාකරණ රටා හඳුනාගෙන භාවිත කරයි. |
| **නිපුණතා මට්ටම** | **5.6** අනාගත කාල වාක්‍ය නිවැරදි ව භාවිත කරයි. |
| **කාලච්ඡේද සංඛ්‍යාව** | 06 |

**ඉගෙනුම් පල**

- පුරුෂත්‍රයට අනුව සාමාන්‍ය අනාගත කාල ක්‍රියා ප්‍රත්‍යය යොදා ක්‍රියා පද නිර්මාණය කරයි.
- උක්තයට ගැළපෙන පරිදි ක්‍රියා පදය යොදයි.
- අනාගත කාලයෙන් අදහස් ප්‍රකාශ කරයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ක්‍රියා ධාතුවට අනාගත ක්‍රියා ප්‍රත්‍ය යොදා අනාගත කාල ක්‍රියාව නිර්මාණය කළ යුතු බව.
- උක්තයට ගැළපෙන පරිදි ක්‍රියා ප්‍රත්‍ය තෝරා ගත යුතු බව.
- නිශේධාර්ථ සහ ප්‍රශ්නාර්ථ වාක්‍ය ලිවීමට පුහුණු විය යුතු බව.
- අනාගත ප්‍රත්‍ය එක් වන විට ක්‍රියා පද කිහිපයක රූපය වෙනස් වන බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- අනාගත කාල ක්‍රියා ප්‍රත්‍ය යෙදෙන ආකාරය දැක්වෙන වගුවක් සිසුන්ට ලබා දෙන්න.
- සාකච්ඡා මාර්ගයෙන් අනාගත කාල ක්‍රියා ප්‍රත්‍ය හඳුන්වා දෙන්න.
- සිසුන් ලවා අනාගත කාල ක්‍රියා නිර්මාණය කරවන්න.
- ඒවා වාක්‍යවල යොදවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- පරිශීලන ව්‍යාකරණ ග්‍රන්ථ

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- අනාගත ක්‍රියා ප්‍රත්‍ය නම් කරයි.
- අනාගත කාල ක්‍රියා නිර්මාණය කරයි.
- අනාගත කාල ක්‍රියා යොදා ගනිමින් වාක්‍ය නිර්මාණය කරයි.
- වර්තමාන කාල වාක්‍ය අනාගතයට හරවා ලියයි.

**නිපුණතාව** **6** හින්දියෙන් ගණන් කිරීමේ හැකියාව ලබයි.

**නිපුණතා මට්ටම** **6.1** පූර්ණ සංඛ්‍යා ගණන් කරයි.
**6.2** භාග සංඛ්‍යා ගණන් කරයි.

**කාලච්ඡේද සංඛ්‍යාව** 04

**ඉගෙනුම් පල**

- 1 සිට 25 දක්වා ගණන් කරයි.
- 1 සිට 25 දක්වා අපූර්ණ සංඛ්‍යා ගණන් කරයි.
- විවිධ ස්ථාන සඳහා සංඛ්‍යා භාවිත කරයි.
- සංඛ්‍යාවල නාගරී සංකේත ලියයි.

**විෂය කරුණුවල සංක්ෂිප්තය**

- 1 - 25 දක්වා සංඛ්‍යා ස්මරණය කර ගත යුතු බව.
- කාල, භාගය, තුන් කාල, එකයි කාල, එක හමාර හා දෙක හමාර සඳහා විශේෂ යෙදුම් ඇති බව.

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- 1 සිට 25 දක්වා පූර්ණ සංඛ්‍යා සහ අපූර්ණ සංඛ්‍යා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- සිසුන්ට ගණන් කර පෙන්වන්න.
- සිසුන් ලවා ගණන් කරවන්න.
- සංඛ්‍යා විවිධ ස්ථානවල යොදමින් අභ්‍යාස කරවන්න.

**ගුණාත්මක යෙදවුම්**

- සංඛ්‍යා සහිත පුවරු

**තක්සේරුව හා ඇගයීම සඳහා නිර්ණායක**

- 1 සිට 25 දක්වා සංඛ්‍යා මතකයෙන් කියයි.
- 1 සිට 25 දක්වා සංඛ්‍යා මතකයෙන් ලියයි.
- භාග සංඛ්‍යා යොදා අදහස් ප්‍රකාශ කරයි.
- නාගරී සංකේත ලියයි.

## තක්සේරුව හා ඇගයීම

**හැඳින්වීම**

පන්ති කාමරය තුළ ඵලදායී ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස ගුරු මහත්ම මහත්මීන් ශිෂ්‍යයන් ලබා සිටින ප්‍රාප්ති මට්ටම් සහ ඔවුන් මුහුණපා සිටින ඉගෙනුම් දුෂ්කරතා පිළිබඳ සුවිශේෂ ලෙස අවබෝධ කරගෙන සිටීම අත්‍යවශ්‍ය ය. එය එක් එක් ශිෂ්‍යයා හට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීම පිණිස බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. මෙම පුළුල් අරමුණෙන් යුතු ව පන්ති කාමරය තුළ ශිෂ්‍යයන්ගේ ප්‍රගතිය පිළිබඳ නිරන්තරයෙන් තොරතුරු රැස්කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම යනුවෙන් සරල ව හැඳින්විය හැකි ය.

තක්සේරු කිරීමේ විවිධ භාවිතයන් ඇත. තේරීම් කාර්යය, ස්ථාපන කාර්යය, පර්යේෂණ කාර්යය ඒ අතරින් ප්‍රධාන ය. එහෙත් පන්ති කාමරය තුළ ගුරුවරයෙකුට ශිෂ්‍යයන්ගේ ඉගෙනීමේ ගැටලු අනාවරණය කරගෙන අපේක්ෂිත ඉගෙනුම් මට්ටම් කරා ශිෂ්‍යයන් නියාමනය කිරීම සඳහා අත්‍යවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම පිණිස එය ප්‍රයෝජනවත් වේ. තක්සේරු කිරීම පන්ති කාමරය තුළ ක්‍රියාත්මක විය යුත්තේ එම පුළුල් අරමුණෙන් යුතුව ය.

පන්ති කාමරය තුළ කරනු ලබන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය දෙයාකාරයකට ක්‍රියාත්මක කළ හැකි ය. එනම් සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනුම අඛණ්ඩ ලෙස සම්භවන ආකාරයට ක්‍රියාත්මක කිරීම සහ වසරක්, වාරයක්, පාඩම් ඒකකයක්, තේමාවක් ලෙස සම්පිණ්ඩිත ආකාරයට තක්සේරු කිරීමත් ය. මෙම ගුරු මාර්ගෝපදේශයේ සෑම ඒකකයක් අවසානයේ ම එම පාඩමින් ශිෂ්‍යයන් සංවර්ධනය කරගත යුතු කුසලතා සැලකිල්ලට ගෙන තක්සේරු කිරීමේ නිර්ණායක ඉදිරිපත් කර ඇත.

පන්ති කාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන අතරතුර මෙම ඉගෙනුම් මට්ටම් කරා ශිෂ්‍යයන් පැමිණ තිබේ ද?. නැතහොත් ඔවුන් දුෂ්කරතා පෙන්නුම් කරන්නේ ද? යන්න හඳුනා ගනිමින් කටයුතු කිරීමට ගුරුවරයෙකුට පුළුවන. මෙවැනි සම්භවන තක්සේරු කිරීමේ ක්‍රියාවලියකදී ගුරුවරයෙකුට ශිෂ්‍යයන් හඳුනා ගැනීම පිණිස, ශිෂ්‍යයන්ගේ ක්‍රියාකාරකම් නිරීක්ෂණය කිරීම හා ශිෂ්‍යයන් සමග සාකච්ඡා කිරීම වැනි අවිධිමත් තක්සේරු කිරීමේ ක්‍රම භාවිතයට ගත හැකි ය. එයට අමතර ව කෙටි සටහනක් ලියවීම, පෙළපොතේ අභ්‍යාසවලට දෙන පිළිතුරු ඇගයීමට ලක්කිරීම වැනි ක්‍රමවේද ද භාවිතයට ගත හැකි ය. එසේ ම දෙවනුවට සඳහන් කළ සම්පිණ්ඩිත තක්සේරු කිරීම සඳහා මාසයක්, වාරයක්, අවුරුද්දක් අවසානයේ පවත්වන පරීක්ෂණ හෝ මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ඉදිරිපත් කොට ඇති ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක නිදර්ශක ලෙස භාවිත කරමින් සකස් කරගන්නා ආධාරක යොදා ගත හැකි ය.

ශිෂ්‍යයන් තක්සේරු කිරීම සඳහා පරීක්ෂණ යොදාගන්නා විට තමා විසින් ම සකස් කරගනු ලබන පරීක්ෂණ උපයෝග කරගන්නේ නම් වඩාත් ඵලදායී වනු ඇත. පන්ති කාමරය තුළ කරන ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම පිණිස වඩාත් වලංගුතාවකින් යුක්ත වන්නේ අදාළ ගුරුවරුන් විසින් සකස් කර ගනු ලබන පරීක්ෂණ ය. ගුරු මහත්ම මහත්මීන් ඒ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා වර්ධනය කර ගත යුතු ය.

මෙම පසුබිම යටතේ පන්ති කාමරය තුළ කෙරෙන ශිෂ්‍ය ප්‍රගතිය තක්සේරු කිරීම ශිෂ්‍යයන් හොඳින් හඳුනා ගෙන එක් එක් ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයේ ඉගෙනුම් අත්දැකීම් ලබා දී අපේක්ෂිත ඉගෙනුම් පල කරා ඔවුන් නියාමනය කිරීමේ මූලික පරමාර්ථය පෙරදැරි කර ගෙන ක්‍රියාත්මක විය යුතු ය.

එක් එක් නිපුණතා මට්ටම්වලට අදාළ ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු අනුපිළිවෙළ සහ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක කිහිපයක් නිදර්ශක ලෙස මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ඉදිරිපත් කොට ඇත. ඒවා අනුසාරයෙන් ඒ ඒ වාරවලට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක ගුරුවරයා විසින් ම උචිත පරිදි සකස් කර ගත යුතු ය.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ ආධාරක

1. පාසල් වාරය : පළමුවන වාරය

2. ආධාරක අංකය : 01

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 2.1, 2.2, 2.3, 2.4, 3.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - සම්මත හින්දී වර්ණමාලාව නිවැරදි ව ලියයි.
   - ස්වර පිල්ලම් නිවැරදි ව ලියයි.
   - ව්‍යඤ්ජන සංයුක්ත ව ලියයි.
   - හින්දී වචන නිවැරදි ව ලියයි.
   - සවන් දී හින්දී ශබ්ද හඳුනා ගනියි.

5. ආධාරකයේ ස්වභාවය :
   - ලිඛිත පරීක්ෂණයක්

6. ආධාරකයේ අරමුණු
   - ස්වර පිල්ලම් නිවැරදි ව යෙදීමට හුරු කිරීම.
   - සංයුක්ත අක්ෂර නිවැරදි ව යෙදීමට හුරු කිරීම.
   - හින්දී වචන ලිවීමට හුරු කිරීම.
   - හින්දී ශබ්ද හඳුනා ගැනීමට හුරු කිරීම.

7. ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස් :

***ගුරු භවතුන් සඳහා උපදෙස්***

- අල්පප්‍රාණ, මහාප්‍රාණ අක්ෂර, ස්වර පිල්ලම් සහ සංයුක්ත අක්ෂර සහිත සරල ගද්‍ය පාඨයක් සුදුසු ක්‍රමයක් භාවිත කරමින් සිසුන්ට ලබා දෙන්න.
- අල්පප්‍රාණ, මහාප්‍රාණ අක්ෂර හඳුනා ගැනීම, ස්වර පිල්ලම් භාවිතය, සංයුක්ත අක්ෂර යෙදීම ආදිය තහවුරු වන පරිදි සිසුන් කේවල ව අභ්‍යාසවල නිරත කරවන්න.

***සිසුන් සඳහා උපදෙස්***

- දී ඇති උපදෙස් මැනවින් අනුගමනය කරමින් අභ්‍යාසයෙහි නිරත වන්න.

8. ඇගයීම් ක්‍රමය :

| සිසුන්ගේ නම් / නිර්ණායක | අල්පප්‍රාණ සහ මහාප්‍රාණ අකුරු නිවැරදි ව ලියයි | ස්වර පිල්ලම් නිවැරදි ව යොදයි | සංයුක්ත අක්ෂර නිවැරදි ව යොදයි | පැහැදිලි බව සහ නිවැරදි බව | කාල කළමනාකරණය | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි - 04

හොඳයි - 03

මධ්‍යස්ථයි - 02

සංවර්ධනය විය යුතුයි - 01

# ඉගෙනුම් ඉගැන්වීම් ප්‍රවර්ධනය කිරීමේ ආධාරක

1. පාසල් වාරය : දෙවන වාරය

2. ආධාරක අංකය : 02

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 3.3 , 5.1 , 5.2 , 6.1

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
   - සරල විධානයන්ට සවන් දී ප්‍රතිචාර දක්වයි.
   - නාම පද භාවිත කරයි.
   - සර්ව නාම පද භාවිත කරයි.
   - පූර්ණ සංඛ්‍යා හඳුනා ගනියි.

5. ආධාරකයේ ස්වභාවය :
   - ශ්‍රවණ පරීක්ෂණයක්

6. ආධාරකයේ අරමුණු
   - සරල විධානවලට සවන් දී ප්‍රතිචාර දැක්වීමට හුරු කිරීම.
   - නාම පදවල ඒකවචන - බහුවචන භේදය හඳුනා ගැනීමට හුරු කිරීම.
   - ඒකවචන සහ බහුවචන වශයෙන් සර්ව නාම පද හඳුනාගැනීමට හුරු කිරීම.
   - සංඛ්‍යා හඳුනා ගැනීමට හුරු කිරීම.

7. ආධාරකය ක්‍රියාත්මක කිරීමට උපදෙස් ඃ

*ගුරු භවතුන් සඳහා උපදෙස්*

- ඉහත විෂය සන්ධාරයට අදාළ ශ්‍රවණාවබෝධය මැනීම සඳහා වු පැවරුමකට සවන් දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ ඇසුරෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමට අවස්ථාව ලබා දෙන්න.
- පිළිතුරු අගයන්න.

*සිසුන් සඳහා උපදෙස්*

- ගුරුවරයා ලබා දෙන පැවරුමට අවධානයෙන් සවන් දෙන්න.
- සවන් දී පිළිතුරු ලකුණු කරන්න.
- එම පිළිතුරු පංතියට ඉදිරිපත් කරන්න.

8. ඇගයීම් ක්‍රමය :

| සිසුන්ගේ නම් / නිර්ණායක | අවධානයෙන් සවන්දෙයි | නාම පද නිවැරදි ව හඳුනා ගනියි | වචන භේදය නිවැරදි ව අවබෝධ කර ගනියි | පූර්ණ සංඛ්‍යා හඳුනා ගනියි | ඒකවචන, බහුවචන ලෙස සර්ව නාම පද හඳුනා ගනියි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි - 04

හොඳයි - 03

මධ්‍යස්ථයි - 02

සංවර්ධනය විය යුතුයි - 01

1. පාසල් වාරය : තුන්වන වාරය

2. ආධාරක අංකය : 03

3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම් : 4.1 , 4.3 , 4.4

4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය :
- අවස්ථානුකූල ව ආචාර කරයි.
- එකිනෙකා හඳුනා ගනියි.
- පෞද්ගලික තොරතුරු විමසයි. ප්‍රතිචාර දක්වයි.

5. ආධාරකයේ ස්වභාවය :
- වාචික පරීක්ෂණයක්

6. ආධාරකයේ අරමුණු
- අවස්ථානුකූල ව ආචාර කිරීමට හුරු කිරීම.
- පෞද්ගලික තොරතුරු විමසීමට හුරු කිරීම.

*ගුරු භවතුන් සඳහා උපදෙස්*

- සිසුන් යුගල වශයෙන් බෙදා ඔවුන්ට ආදර්ශ සංවාදයක් ලබා දී ඒ අනුව තමාට අදාළ වන ලෙස සංවාදයක් නිර්මාණය කිරීමට උපදෙස් දෙන්න.
- නිර්ණායක පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- එම සංවාදය පංතියෙහි දී ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

*සිසුන් සඳහා උපදෙස්*

- තමාට අදාළ වන ලෙස සංවාදය නිර්මාණය කරන්න.
- අවශ්‍ය අංග චලනයන්ගෙන් යුතු ව පන්තියෙහි දී ඉදිරිපත් කරන්න.
- එම පිළිතුරු පංතියට ඉදිරිපත් කරන්න.

8. ඇගයීම් ක්‍රමය :

| සිසුන්ගේ නම් / නිර්ණායක | අවස්ථානුකූල ව ආචාර කිරීමේ යෙදුම් භාවිත කරයි | ප්‍රශ්නවාචක පද නිවැරදි ව යොදයි. | අසනු ලබන ප්‍රශ්නවලට නිවැරදි ව පිළිතුරු දෙයි | වියරණ නිවැරදි ව භාවිත කරයි | සබකෝලයෙන් තොර ව නාට්‍යානුසාරයෙන් ඉදිරිපත් කරයි | එකතුව |
|---|---|---|---|---|---|---|
| | | | | | | |

**ලකුණු පරාසය**

ඉතා හොඳයි - 04

හොඳයි - 03

මධ්‍යස්ථයි - 02

සංවර්ධනය විය යුතුයි - 01